| |
|---|
| සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා<br>චක්‍රලේඛ ලිපි අංක: 01/2020 |

මගේ අංකය:PPSC/ES/03/FI/06/1-3
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2020.01. 07

*සබරගමුව පළාත් සභාවේ,*

01. ප්‍රධාන ලේකම්
02. ආණ්ඩුකාරවර ලේකම්
03. සභා ලේකම්/සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
04. පළාත් කොමසාරිස්වරුන්/පළාත් අධ්‍යක්ෂවරුන්
05. දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ I ශ්‍රේණියේ රියැදුරන් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 - පෙබරවාරි</u>

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ රියදුරු මහතුන්ගේ උක්ත විභාගය සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ. එබැවින් මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ රියදුරු මහතුන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. (I ශ්‍රේණියේ උසස්වීම් දිනය 2013.05.30 දිනට පසුව යෙදෙන අය සඳහා පමණක් අදාල වේ.)

02. මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| විෂය අංකය | විෂයය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | මහා මාර්ග නීතිය හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම | පැය 01 | 100 |
| 02 | <u>ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි</u><br>• ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩය:<br>පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>II කාණ්ඩය : සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ දැනුම<br>• මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම | පැය 01 | 100 |

03. මෙය ලිඛිත විභාගයක් වන අතර, පැය 01 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා උපරිම ලකුණු 100කි. **සාමාර්ථ සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගත යුතුය.**

04. මේ අනුව මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය නිලධාරීන් මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාර අයදුම්පත් තම පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් 2020.02.01 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

04. පළමුවරට මෙම විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු නොගෙවිය යුතු අතර, මීට පෙර I වන ශ්‍රේණියේ රියදුරු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී හෝ විභාගයට පෙනී නොසිට නැවත අයදුම්කරන්නේ නම් රු.300/-ක , විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පසුපිට නොගැලවෙන සේ ඇලවිය යුතුය.

05. මෙම විභාගය පවත්වන දිනය, ස්ථානය අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍ර මඟින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ. මෙම චක්‍රලේඛයේ විධිවිධාන සළකා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

පී.එස්.ආර්.එම්.විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය-රත්නපුර

ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**<u>සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ ගුරු සේවයේ I ශ්‍රේණියේ ගුරුවරුන් සඳහා වන</u>**
**<u>III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020</u>**

01. I අයදුම්කරුගේ මුල්අකුරු සමඟ නම: ..........................................................................
(සිංහලෙන්)
II මුල්අකුරු සමඟ නම: ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා: SUNIL A.B.
III මුල්අකුරු වලින් හැඳින්වෙන නම : ..........................................................................
(සිංහලෙන්) ..........................................................................

02. වර්තමාන සේවා ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................
(විභාග ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) ..........................................................................

03. ගුරුවරු තනතුරට පත්වූ දිනය : ..........................................................................

04. ගුරුවරු සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබූ දිනය : ..........................................................................

05. විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය : ..........................................................................
(සිංහල හෝ දෙමළ)

06. දුරකථන අංකය :
රාජකාරී :.......................................... පෞද්ගලික : ..........................................

07. මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇති අංක 01/2020 දරන සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපියේ සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු අයෙකු නම් එම විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :-

(1) විභාග ගාස්තු ගෙවූ කාර්යාලයේ නම :- ..........................................................................
(2) ඒ සඳහා නිකුත් කළ කුවිතාන්සි අංකය හා දිනය :- ..........................................................................
*(විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය මෙම අයදුම්පත්‍රයේ පසුපිටෙහි අලවන්න.)*

ඉහත විස්තර නිවැරදි බව සහතික කරමි.

..........................................  ..........................................
දිනය  අයදුම්කරුගේ අත්සන

**<u>අත්සන සහතික කිරීම.</u>**

මාගේ කාර්යාලයේ නිලධාරියකු සහ මා පෞද්ගලික වශයෙන් දන්නා .......................................... මහතා .......................................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, සහතික කරමි.

..........................................  ..........................................
දිනය  සහතික කරන්නාගේ අත්සන
පදවි නාමය සහ නිල මුද්‍රාව

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය</u>**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .......................................... මහතා මෙම ආයතනයේ සේවය කරන ස්ථිර තනතුරක් දරන අයෙකු බවද, අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව හා කාර්යාලයේ ඇති වාර්තා අනුව නිවැරදි බව ද මෙම නිලධාරියා කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තු ගෙවා කුවිතාන්සිය මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

..........................................  ..........................................
දිනය  දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිලමුද්‍රාව තබන්න.)